ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>මහ කොමසාරිස්තුමාගේ උතුරු පළාත් සංචාරය ඉන්දියාව ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ සිටින බව අවධාරණය කරයි</u>

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා 2023 නොවැම්බර් 29 සිට දෙසැම්බර් 1 වන දා දක්වා උතුරු පළාතේ තෙදින සංචාරයක නිරත විය. මහ කොමසාරිස් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනෙකු ද එතුමා සමඟ මෙම සංචාරයට එක් වූහ.

2. ශ්‍රී ලාංකික ජනතාවගේ සුබසිද්ධිය සඳහා ඉන්දියා - ශ්‍රී ලංකා සංවර්ධන සහයෝගීතාවය යටතේ දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සාක්ෂි සපයමින් මෙම නියෝජිත පිරිස ඉන්දීය ණය පහසුකමක් යටතේ සපයන ලද නවීන දුම්රියකින් කොළඹ සිට මැදවච්චිය බලා ගමන් ගත්හ. අනුරාධපුර සිට ප්‍රතිසංස්කරණය කරන ලද දුම්රිය මාර්ගයේ සුව පහසුව අත්විඳීමට ද මෙම දුම්රිය ගමන අවස්ථාවක් ලබා දුන්නේය. ප්‍රමුඛ පෙළේ ඉන්දීය රාජ්‍ය ආයතනයක් වන IRCON සමාගම විසින් දැනට ක්‍රියාත්මක ඉන්දීය ණය පහසුකමක් යටතේ මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලදී.

3. මෙම නියෝජිත පිරිස අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ස්ථාන අතර බෝට්ටු සේවා ක්‍රියාත්මක කිරීම හරහා සම්බන්ධකතාවය ඉහළ නැංවීමට ගන්නා ප්‍රයත්නයන් ප්‍රකාරව නොවැම්බර් 29 වන දින තලෙයි මන්නාරම සහ කන්කසන්තුරය මගී පහසුකම් වෙත සංචාරය කළෝය. ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් 2023 ජූලි මාසයේදී සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුර ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා සහ ජනාධිපති රනිල්

වික්‍රමසිංහ මැතිතුමා විසින් ඒකාබද්ධව ප්‍රකාශයට පත් කරන ලද ආර්ථික හවුල්කාරිත්ව දැක්මෙහි කේන්ද්‍රීය තේමාව වන්නේ සම්බන්ධකතාවය යි. බෝට්ටු සේවා සාමාන්‍ය පරිදි නැවත කඩිනමින් ආරම්භ කිරීම සඳහා දෙරටෙහිම අවධානය යොමුව තිබෙන අතර දෙරටම ඒ සඳහා සමීපව කටයුතු කරයි.

4. මහ කොමසාරිස්තුමා නොවැම්බර් 30 වන දින දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධතීන් ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම සොයා බැලීම සඳහා යාපනයේ නයිනතිව්, අනලතිව් සහ ඩෙල්ෆ්ට් යන දූපත් තුනේ ද සංචාරය කළේය. ඉන්දීය රජය මෙම දූපත්වල ජීවත් වන ජනතාවගේ බලශක්ති අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ඉන්දීය ප්‍රදාන යටතේ සහය ලබා දීමට පොරොන්දු වී ඇත.

5. සමාජයේ විවිධ ක්ෂේත්‍රවල අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දක්වමින් මහ කොමසාරිස්තුමා මන්නාරම දිස්ත්‍රික්කයේ සිසු සිසුවියන් සඳහා පාසල් බෑග් 1000ක් බෙදා දීමේ වැඩසටහනක් සමාරම්භ කළේය. නොවැම්බර් 29 වන දින පැවති මෙම වැඩසටහන සඳහා ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍ය කාදර් මස්තාන් මහතා ද සහභාගී විය. මහ කොමසාරිස්තුමා දෙසැම්බර් 1 වන දින යාපනය විශ්ව විද්‍යාලයේ අඩු ආදායම්ලාභී පවුල්වල සිසු සිසුවියන් සඳහා විශේෂ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් ද ආරම්භ කළේය. මෙයට අමතරව එතුමා යාපනයේ සහ ඩෙල්ෆ්ට් දූපතේ පවුල් 500කට අධික පිරිසකට වියළි සලාක ද බෙදා දුන්නේය. යාපනය ප්‍රදේශයේ ධීවරයන්ගේ පරිහරණය සඳහා අධි ශීතකරණ 15ක් ද මහ කොමසාරිස්තුමා විසින් ධීවර සංගම් 15ක් වෙත බෙදා දෙන ලදී. පසායියූර් ප්‍රදේශයේ ධීවර සංගම් නියෝජිතයන් සමඟ පිළිසඳරක නිරත වෙමින් මහ කොමසාරිස්තුමා අවධාරණය කළේ ඉන්දියාව උතුරු පළාත ඇතුළු ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රයේ වාණිජ වශයෙන් තිරසාර සංවර්ධනය උදෙසා විද්‍යාත්මක පර්යේෂණ සහ ප්‍රවීණත්වයේ ප්‍රතිලාභ ගෙන ඒමට කැපවී කටයුතු කරන බවයි. මේ අනුව ප්‍රතිලාභ ඍජුවම ධීවරයන්ට සහ සාමාන්‍ය ජනතාවට හිමි වනු ඇත.

6. මහ කොමසාරිස්තුමා දෙසැම්බර් 1 වන දින යාපනය ඉන්දීය සාම සාධක හමුදා ස්මාරකයේ දී ශ්‍රී ලංකාවේ දී දිවි පිදූ නිර්භීත ඉන්දීය පුත්‍රයන් උදෙසා සිය උපහාරය පළ කළේය.

7. මෙය මහ කොමසාරිස්තුමාගේ ශ්‍රී ලංකාවේ ධුර කාලය අතරතුර සිදු කරන ලද යාපනය සංචාර කිහිපය අතරින් අවසාන සංචාරය වන අතර එම සංචාරය උතුරු පළාතේ ජනතාවගේ ප්‍රමුඛතා සහ අවශ්‍යතාවයන් අනුව සංවර්ධන සහයෝගීතාවය ඉහළ නැංවීම සහ ආර්ථික හවුල්කාරිත්වය පුළුල් කිරීම හරහා උතරු පළාත ඇතුළු ශ්‍රී ලංකාවේ ජනතාවගේ සංවර්ධනය සහ සුබ සිද්ධිය උදෙසා ඉන්දියාවේ අචල කැපවීම අවධාරණය කරයි.

***

***කොළඹ***
***2023 දෙසැම්බර් 2***